**රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2022**

**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | I. මුදල් රෙගුලාසි 134(3) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකල යුතු වුවත් විද්‍යායතනය ආරම්භ කල 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනය සතුව අනුමත අභ්‍යන්තර විගණක කෙනෙකු නොමැති අතර වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොමැති බව. | අභ්‍යන්තර විගණනයන් සිදු කිරීමට කටයුතු කල යුතුය. |
| | II. මුදල් රෙගුලාසි 571 | තැන්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්මවූ රු. 195,000 ක් වූ ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම රු.195,000 ක මුදල රාජ්‍ය ආදායමට මේ වර්ෂයේදී බැරකිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2021 හා 2022 වර්ෂ සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඇති අතර එහි පිටපතක් විගණකාධිපති වෙත යොමුකිරීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කල යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 30,291,210 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 29,237,093 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,054,117 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 කණ්ඩායමට අදාලව 2022 වර්ෂයේදී පවත්වන ලද විභාග සඳහා ඒ ඒ විෂයයන් වෙනුවෙන් සිසුන් 169 දෙනෙකු අයදුම්කර තිබුණද, ඉන් සිසුන් 79 දෙනෙකු එම විෂයයන්ට අදාල ලිඛිත කාර්යය පැවරුම් ඉටුකර නොතිබීම, විභාග සඳහා සිසුන් 21 දෙනෙකු පෙනී නොසිටීම හා සිසුන් 07 දෙනෙකු විභාග අසමත් වී තිබීම විගණනයේදී අනාවරණය විය. සිසුන් විභාගවලට පෙනී නොසිටීමේ හා අසමත් වීමේ ප්‍රමාණය වර්ධනය වී ඇතත් විද්‍යායතනය විසින් ඒ පිළිබඳ පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි. | විභාග සඳහා අයදුම්කර විභාග සඳහා පෙනී සිටීම ශිෂ්‍යයන්ගේ කැපවීම සහ වගකීම වන අතර සමහර ශිෂ්‍යයන් විභාග ඉල්ලුම්කර විභාගයට පෙනීසිටීමට පෙර විද්‍යායතනයෙන් ඉවත්වී ඇති අවස්ථාද පෙන්වාදීමට හැකි බව. | සිසුන් විභාගවලට පෙනී නොසිටීමේ හා අසමත් වීමේ ප්‍රමාණය වර්ධනය වීමට හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බාහිර කථිකාචාර්යවරුන් විසින් පාඨමාලාවන්ට අදාල විෂයයන් (Module) 39 ක් වෙනුවෙන් 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදය තුළදී ආවරණය කලයුතු යැයි සැලසුම් කල දේශන පැය ප්‍රමාණය 3,186 ක් වුවද සත්‍ය වශයෙන් දේශන පැය 1,230 ක් පමණක් සිදුකර තිබුණි. සැලසුම් කරන ලද පැය ගණනට සාපේක්ෂව සම්පූර්ණ නොකරන ලද පැය ගණන සියයට 13 සිට සියයට 70 දක්වා පරාසයක පැවතුණි. | අදාළ විෂය නිර්දේශයන්හි එක් එක් මොඩියුලයට අදාල නියමිත පැය ගණන ආවරණය නොවීමේ තත්ත්වය ඉස්මතුවනුයේ රටෙහි පැවති කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදය, විදුලිය බිඳවැටීම වැනි කරුණු කාරණාවන් නිසා බව. | විෂය නිර්දේශය ආවරණය වන පරිදි නියමිත පැය ගණන අනුව දේශන පැවැත්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල විද්‍යායතන සමඟ නිසි සම්බන්ධීකරණයක් නොපැවැත්වීම හේතුවෙන් රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා සිසුන් අයදුම්කිරීමේ | ශිෂ්‍යයින් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි වීමට අප පාඨමාලා හැරගොස් තිබෙන බව. | සිසුන් බඳවාගැනීමේ කටයුතු නිසි සැලසුමකට අනුව සිදුකල යුතුය. |

ප්‍රගතිය 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී සියයට 44 කින් පහත වැටී තිබුණු අතර සිසුන් 18 දෙනෙකු මුල් කාලසීමාව තුලම පාඨමාලා හැරගොස් තිබුණි. එසේම 2022 වර්ෂය සඳහා එම වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී සිසුන් බඳවාගැනීමේ කටයුතු සිදු කලයුතු වුවත් විගණිත දිනය වූ 2023 ජනවාරි 26 දින වන විටත් සිසුන් බඳවා ගැනීමේ කාර්යය අවසන් කර නොතිබුණි.

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආහාර තාක්ෂණ විද්‍යාගාරයේ පැවති රු. 147,400 ක් වටිනා Automatic Water Distiller උපකරණය 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවති අතර එම උපකරණයේ වගකීම් කාලයද අවසන් වී තිබුණි. | මෙම උපකරණය අමාත්‍යාංශය විසින් එවන ලද අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා අප ආයතනයේ ආහාර තාක්ෂණ විද්‍යාගාරය නිසි පරිදි සකස් කර නොමැත. මෙම උපකරණයේ වර්තමාන වෙළඳපල වටිනාකම, එය මිලට ගන්නා කාලයට වඩා බොහෝ වැඩිය. එනිසා විද්‍යාගාරයේ කටයුතු නිමකරන තෙක් මෙම උපකරණය සුරක්ෂිතව අප ආයතනය තුල තිබෙනු ඇත. | සම්පත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් භාවිත කිරීමට කටයුතු කල යුතුය. |

### 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිපුණතා ආංශික සංවර්ධන (SSDP) වැඩසටහන යටතේ 2021 වර්ෂයේදී කාර්යයන් 03 ක් ඉටු කිරීම වෙනුවෙන් ලැබී තිබුණු රු. මිලියන 5.8 ක් විගණිත දිනය වූ 2023 පෙබරවාරි 08 දක්වාම උපයෝජනය කර නොතිබුණි. | 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව මෙම ගොඩනැගිල්ල පන්ති කාමරයක් සහ ආහාර තාක්ෂණ කථිකාචාර්යවරුන් සඳහා වෙන්කර දීමට සැලසුම් කර තිබෙන බව.<br>අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් ගමන් සහ සංචාරක පාඨමාලාව වෙනුවෙන් මොඩියුල දෙකක් හඳුන්වාදීමට යෝජනා කලද ප්‍රායෝගික ගැටලු හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව.<br>ශිෂ්‍ය ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම කල අතර ආයතනය බලාපොරොත්තු වූ පද්ධතිය සැපයීමට සැපයුම්කරු අපොහොසත් වීම හේතුවෙන් අවසන් කිරීමට නොහැකි වූ බව. | ණය ආධාර මඟින් ලබාදෙන ප්‍රතිපාදන තුලින් උපරිම ප්‍රයෝජන ලැබෙන සේ උපයෝජන කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2022 වර්ෂය සඳහා රු. මිලියන 07 ක ප්‍රාග්ධන | මෙම ව්‍යාපෘති යෝජනා විවිධ වූ ගැටළු හේතුවෙන් ප්‍රමාද වී ඇති බව. | ව්‍යාපෘති යෝජනා |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදන යටතේ ආහාර තාක්ෂණ විද්‍යාගාරය නවීකරණය, ශිෂ්‍ය ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම, අධ්‍යයන වගකීම්, කණ්ඩායම් වැඩ හා පර්යේෂණ සඳහා වැඩමුළු පැවැත්වීම යන ප්‍රධාන සංරචක 03 ක් ඉටු කිරීමට වෙන්කර තිබුණද එම කාර්යයන් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | | ක්‍රියාත්මක කරවීමට කටයුතු කල යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනය විසින් පවත්වාගෙන යනු ලබන NVQ Level 05 හා 06 සඳහා අවම වශයෙන් කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බැගින් සිටිය යුතු වුවද ඉන් පාඨමාලා 04 ක් සඳහා එක් කථිකාචාර්යවරයෙකු බැගින් පමණක් සිටින බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඉහත බඳවාගැනීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු විද්‍යායතන මට්ටමින් සිදුකර ඇති අතර අමාත්‍යාංශ අනුමැතිය ලැබී නොමැති බැවින් මෙතෙක් බඳවාගැනීමට නොහැකි විය. කථිකාචාර්ය පුරප්පාඩු පිරවීමටද අමාත්‍යාංශ අනුමැතිය ලැබී නොමැති අතර බාහිර කථිකාචාර්යවරුන් මගින් අදාල විෂය ඉගැන්වීම් සිදුකරගෙන යනු ලැබේ. | අදාල පාඨමාලා සඳහා සිටිය යුතු අවම කථිකාචාර්යවරු සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |